# දම්පල් දම් මග



1991 මැයි 31 වැනි ද බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ පැවැති මහා බෝධි සමාගමේ ශත සංවත්සර උත්සවයේ දී ජනාධිපති ශ්‍රීමත් රණසිංහ ප්‍රේමදාස මැතිතුමා කළ කථාව

BKT 0140
6/08/2023

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

# දම්පල් දම් මග

1991 මැයි 31 වැනි ද බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ පැවැති මහා බෝධි සමාගමේ ශත සංවත්සර උත්සවයේ දී ජනාධිපති ශ්‍රීමත් රණසිංහ ප්‍රේමදාස මැතිතුමා කළ කථාව

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

# දම්පල් දම් මඟ

" එ දා ධර්මපාලතුමා කොයි දේ කළෙත් අප ගේ මානසික වහල් බව ඉවත් කිරීමට යි. එය එ දා වහල් යුගයෙහි අත්‍යවශ්‍ය වූ දෙයෙකි. එහෙත් අදත් මානසික වහල් බව අප අතරේ පවතින බව පෙනේ.

අපට භාෂාවක්, ඇඳුම්, චාරිත්‍ර වාරිත්‍ර සමුදායක් අවශ්‍ය වන්නේ එයින් අපේ අනන්‍යතාව රැකගැනීමට විනා එයට ම වහල් වී, එයින් උමතු වී මිනිසුන් අතර සාමය බිඳ හෙළන්න ක්‍රියා මාර්ගයක් ඇති කිරීමට නො වේ. "

*— ජනාධිපති ශ්‍රීමත් රණසිංහ ප්‍රේමදාස*

# දම්පල් දම් මග

## 1991.05.31 වැනි දින බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ පැවැති මහාබෝධි සමාගමේ ශත සංවත්සර උත්සවයේ දී ශ්‍රීමත් ජනාධිපතිතුමා කළ කථාව

*අතිගෞරවාර්හ මහානායක මාහිමිපාණන් වහන්සේලා ඇතුළු*
*ගරුතර මහා සංඝරත්නයෙන් අවසර යි.*
*ගරු දේවධර්මාචාර්ය ඔස්වල් ගෝමස් බිෂොප්තුමා ගෙන් අවසර යි.*
*හින්දු ආගමික ඉස්ලාම් ආගමික පූජකතුමන් ගෙන් අවසර යි.*
*මැති — ඇමතිවරුනි,*
*පින්වත්නි,*

ධර්මපාලතුමා ගැන, අපට අහන්නට ලැබුණේ, ගාමිණී ජයසූරිය මැතිතුමා කිව්වා වාගේ, ඉතා කුඩා කාලෙ. අපේ ගෙදර නිතර රැව්පිළිරැව් දුන්න නමක්, අනගාරික ධර්මපාල කියන නාමය. මගේ හිතේ ඒ ළමා අවදියට ගියොත්, වයස හය - හත කාලෙ ධර්මපාලතුමා ගැන ම තමයි, සාකච්ඡා වුණේ අපේ ගෙදරට එකතු වෙන මගේ පියාණන් වහන්සේ ගේ මිත්‍රයන් අතර කෙරුණ සාකච්ඡාවල දි.

### ළමා වියේ සිට දම්පල් මතකය

තව කාරණයක් හේතු වුණා, ධර්මපාලතුමා දැනකියාගන්න. ඒ දවස්වල මුලින් ම, මා ගියේ, හේවාවිතාරණ ඉරුදින දහම් පාසලට යි. ශ්‍රී

ධර්මදාන සමිතිය නමැති සමාගමක් මගිනුයි හේවාවිතාරණ දහම් පාසල පවත්වාගෙන ගියේ. හේවාවිතාරණ කියන නම, ඒ දහම් පාසලට දීලා තිබුණේ, දොස්තර සී. ඒ. හේවාවිතාරණ මැතිතුමා සිහිපත් කරන්න. ඒ නිසා පාසලේ දීත්, හේවාවිතාරණ පවුල ගැන හුඟාක් තොරතුරු අපේ ගුරුවරුන් ගෙන් දැනකියාගන්නට ලැබුණා.

ධර්මපාලතුමා, හේවාවිතාරණ පවුලෙ දීප්තිමත්, කීර්තිමත් සාමාජිකයෙක්. එතුමා ගේ නම දොන් ඩේවිඩ් හේවාවිතාරණ. ඔය කුඩා අවදියේ දී තමයි, මෙතුමා ගැන තොරතුරු දැනගත්තෙ. එහෙත් ඒවා ළමා හිතේ කිඳා බැස්සා. හිතන්නට තරම් බුද්ධියක්, මානසික තත්වයක් නැතත් කුඩා කාලයේ දී අපේ දූදරුවන්ට යමක් කිව්වම ඒක හිතේ තැන්පත් වෙනවා. මුහුකුරා යන කොට, ඒ තැන්පත් වෙච්ච අදහස්, තොරතුරු ඉහළට එනවා. ඒක ස්වාභාවික දෙයක්.

මට අද වගේ මතකයි, ධර්මපාලතුමා පසු ව, පැවිදි වෙලා, සිරිදේවමිත්ත ධර්මපාල ස්වාමීන් වහන්සේ නමින්, දඹදිව අසනීපයෙන් ජීවත් වීම පිළිබඳ තොරතුරු කනට වැටෙනවා. අපේ දහම් පාසලේ නිරතුරු මේ ගැන කථා වෙනවා. පසු ව ආරංචි වුණා සිරිදේවමිත්ත ස්වාමීන් වහන්සේ අපවත් වුණා ය කියලා. කොළඹ නගරයේ සියලූ ම දහම් පාසල් ඒ ආදාහන උත්සවයට සහභාගි වෙන්නට සූදානම් වුණා. අපවත් වෙලා, සාරනාත්හි එතුමා ගේ ආදාහනය සිදුකරලා භෂ්මාවශේෂ ගෙනාවා කොළඹට. මේ භෂ්මාවශේෂ පිළිගැනීම තමයි, එ දා ලාංකික උදවියට ලැබිච්ච අවස්ථාව. ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමා පසු ව සිරිදේවමිත්ත ධර්මපාල හිමියන්ට, උපහාර දැක්වීමට, ලැබුණ අවස්ථාව.

දහම් පාසල් ළමයි අපි ඔක්කෝම එක්කගෙන ගියා, මැක්ලම් පාරට. භෂ්මාවශේෂ ගෙනාවේ දුම්රියෙන්. විශාල ජනකායක් හිටියා. අපට ලැබුණ නියමය, ධර්මපාලතුමාට අපේ ගෞරවය පිරිනැමීම සඳහා සපත්තු, සෙරෙප්පු නැතුව එන්න. උදේ පාන්දර 9.00 ට විතර අප ගියේ. දුම්රිය පැමිණෙන්ට ප්‍රමාද වුණා. මධ්‍යාහ්නය වුණා දුම්රිය එන්න. ගිනිකාෂ්ටක අව්වෙ. ඒ අවස්ථාව හොඳින් ම මතක තියෙන්නෙ, දෙපතුල් පිච්චි - පිච්චි, අපි පැය ගණනාවක් මැක්ලම් පාරේ පේළි ගැසී හිටපු නිසයි. විශේෂයෙන්ම පසුකාලයක තමයි, අවබෝධ වුණේ, මොන තරම වාසනාවන්තයො ද කියලා ඒ විදියට මේ උතුම් පුද්ගලයට උපහාර දක්වන්නට පුළුවන් වීම.

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

## මහාබෝධි සමාගම

මහාබෝධි සමාගම ආරම්භ කළේ, අනගාරික ධර්මපාලතුමා පරමාර්ථ කීපයක් ගැන. එතුමාට පෙනුණා, පරමවිඥනාර්ථ සමාගමේ ඇතැම් ප්‍රතිපත්ති හා එතුමාට එකඟ වෙන්නට බැරි අවස්ථා තිබුණ බව. ඒ කාරණෙත් හේතු වුණා මහාබෝධි සමාගම ආරම්භ කරන්න. ඊළඟට, එතුමාට වුවමනා කළා, බුද්ධගයා මහා විහාරය, බෞද්ධයන් ගේ අනුග්‍රහය ලබන පූජ්‍යස්ථානයක් බවට පත් කරගන්න.

බුදුරජාණන් වහන්සේ ගේ සත් ධර්මය, ලෝකවාසීන් අතර බෙදාදීමෙත්, ධර්මදූත මෙහෙයටත් මහාබෝධි සමාගම කේන්ද්‍රයක් කර ගන්නට, එතුමා කල්පනා කළා. ඔය පරමාර්ථ උඩ තමයි මහබෝධි සමාගම ආරම්භ කළේ. මහබෝධි සමාගමට අද සියක් වසරක් සම්පූර්ණ වෙනවා. මහබෝධි සමාගම ලංකාවේ ආරම්භ වෙලා, දේශ-දේශාන්තරවල ශාඛා පිහිටුවන්න යෙදුණා. එහි උසස් ප්‍රතිඵල අපට දකින්නට පුළුවන්. අපේ මහා සංඝරත්නය, දේශ-දේශාන්තරවලට යවමින්, බුදුරජාණන් වහන්සේ ගේ සත්ධර්මය කියාදීමට, එතුමා විධිවිධාන සැලැස්සුවා.

මට ධර්මදූතයන් වහන්සේලා, තෝරාගෙන උන්වහන්සේලාට, විවිධ භාෂා පිළිබඳ දැනුම ලබාදුන්නා. මහබෝධි සමාගමේ ධර්මප්‍රචාරක වැඩපිළිවෙළ බොහො ම වේගවත් ව කරන්නට යෙදුණ නිසා, අද අපට පේනවා, එහි ප්‍රතිඵල. එ දා ධර්මපාලතුමා මහාබෝධි සමාගම මගින් ක්‍රියාත්මක කළ ඒ වැඩපිළිවෙළ නිසයි, ලෝකයේ අවධානය මෑත කාලයෙක දී බුදුදහම කෙරෙහි යොමු වුණේ. විශේෂයෙන් ම, භෞතික අන්දමින්, සතුට — ප්‍රීතිය සොයාගෙන යන ලෝකයට ආධ්‍යාත්මික අන්දමින්, සන්තුෂ්ටියක්, තෘප්තියක්, ලබන්නට පුළුවන් ය කියන හැඟීම, අද ලෝ පුරා ම වේගවත් නැඹුරුවීමක් අපට දකින්න තිබෙනවා. මේ ගැන අධ්‍යයනයක් කිරීම වටිනවා. ලෝකයේ නොයෙකුත් නපුරු — නරක දේ සිද්ධ වෙනවා. මත්පැන් පාවිච්චි කරන අය ඉන්නවා. සූදුවෙහි, සුරාවෙහි, දුරාචාරයෙහි යෙදෙන අය ඉන්නවා.

මේ අය අතර, ඇත්ත වශයෙන් ම ගුණගරුක ජීවිතවලට හුරුපුරුදු වෙගන එන විශාල සංඛ්‍යාවක් ඉන්න බවත්, අපට අමතක කරන්නට පුළුවන් කමක් නැහැ. බොහෝ විට හොඳ ඉස්මතු වී නොපෙනෙන්නේ, එය සුද නිසයි. නරක කළු නිසා, සුදු මත කුඩා කළු පැල්ලමක් වුණත්

පැහැදිලි ව පෙනෙනවා. එයින් හැඟෙන්නේ, හැම තැන ම තිබෙන්නේ, කළුවර ය කියන එක නො වෙයි.

ඇත්ත වශයෙන් ම, ලොවපුරා අද, ගුණගරුක භාවයට, ගුණවගාවට ලොකු ඔනෑකමක් තිබෙනවා. ඒ ගුණගරුක භාවය වඩාගන්නට, වගා කරගන්නට, ඉල්ලුමකුත් තිබෙනවා. ආධ්‍යාත්මික හැදියාව කෙරෙහි, නැඹුරු වෙනවා. ඇයි එහෙම නැඹුරු වෙන්නෙ ? ආටෝපයක් සඳහා නො වෙයි. භෞතික වශයෙන් තෘප්තියක් සොයාගෙන ගිය මිනිසාට, ඒ මඟින් වඩවඩාත් දුකට පත් වීමට සිදු වෙන බව අවබෝධ වෙන්නට — අවබෝධ වෙන්නට, මිනිසා නියම සන්තෘෂ්ටිය සඳහා ආධ්‍යාත්මික කරුණුවලට යොමු වෙනවා.

බුද්ධ ධර්මය තුළින්, මිනිසාට කියා දෙන්නේ, තමන් මුහුණපාන, දෛනික මෙන් ම පොදු වශයෙන් තමන් මුහුණපාන අර්බුදවලට, අභියෝගවලට මුහුණදීමට අත්‍යවශ්‍ය චරිත ශක්තිය ලබාගැනීමේ මාර්ගය යි. ලෝකයේ පරාජය, අවහිර, බාධා, හිරිහැර, කරදර, හිංසාව, අසත්‍යය, තිබෙන බව අප කවුරුනුත් දන්නවා. නපුර — නරක, විපත දකින්නට තිබෙන බව කවුරුනුත් දන්නවා. ඒවා සම්පූර්ණයෙන් ම, නැති කරන්නට බැරි බවත් දන්නවා. ඒවා මධ්‍යයෙහි ජීවත් වෙන්නෙ කොහොම ද ?

ඒවාට මුහුණ දෙමින්, ඒවායින් යටපත් වෙන්නෙ නැති ව, ධෛර්යසම්පන්න ව, මානසික වශයෙනුත්, ශාරීරික වශයෙනුත්, ධෛර්යසම්පන්න ව ජීවත් වෙන්නට ඕනෑ කරන ආස්වාදය ආදර්ශය, ලබාගන්නටයි, මිනිසා උත්සාහ කරන්නෙ. ලබාගන්නට පුළුවන් ධර්ම මාර්ගය සොයා, මිනිසා ගමන් කරනවා. අද ලෝකයේ බොහෝ දෙනකු, දුම්පානය අත්හැරගෙන යනවා. මාංශ භක්ෂණය අත්හැරගෙන යනවා. නපුරු — නරක දේවලට යොමු වීමෙන් වළකින්නට උත්සාහ කරනවා. ඇයි එහෙම කරන්නෙ ? ඒනිසා අමුතු ගෞරවයක් ලැබෙන නිසා නො වෙයි. ඒ මාර්ගයෙන් තම — තමන්ට වඩ — වඩා දුක මිසක් සතුටක් නොලැබෙන නිසා, තෘප්තියක් නොලැබෙන නිසා එහෙත් මේවා පිළිබඳ සංඛ්‍යා ලේඛණ සොයාගැනීම අමාරු යි. ඒ අතර නපුරු — නරක, නොදමුණු, විපත්ති හිංසා, ආදිය තිබෙන බව ඇත්ත. ඒවාට හේතුවත් දන් මිනිසා පිළිගෙන තියෙනවා. මිනිස් බුද්ධිය, මිනිසා විසින් ලබාගත්, විද්‍යාත්මක තාක්ෂණික දැනුම, නපුරට, නරකට, හේතු වන දේ

නිෂ්පාදනය කිරීමට, මිනිසා පෙලැඹුණ නිසා. මෙය සිදු වන බවත් මිනිසාට විකෙත් – වික අවබෝධ කරගෙන තියෙනවා.

## රට ට සැපත දුන් උපත

එතුමා උපන් ලංකාව දිහා කල්පනා කරලා බලන්න. අද තරම් ධර්මය කෙරෙහි ලෝකයෙත් ලංකාවෙත්, අවධානය යොමු නොවී තිබුණ යුගයක එතුමා පහළ වුණේ. එතුමා මාතර දිස්ත්‍රික්කයේ, හිත්තටිය ප්‍රදේශයේ කා ගේත් ගෞරවය ලැබූ, පරපුරකට, අයත් ව උපන්නෙ. එතුමා ගේ පියාණන් වහන්සේ, එතුමා ගේ මෑණියන් වහන්සේ, තමන් ගෙ දූ පුතුන් ගුණගරුක අන්දමින් හදා වඩන්නට, වෙහෙස මහන්සි ව ක්‍රියා කළා. මීට කලින් අපේ ගරුතර මහා සංඝ රත්නයෙන්, අවසර ලැබුණ විදියට, මෑණියන් වහන්සේ ගේ, ආස්වාදය බොහෝ සෙයින් ම ධර්මපාලතුමාට ලැබුණා. තරුණ වියේදී ම එතුමා, ධර්ම මාර්ගයට යොමු වුණා.

ඒ ධර්ම මාර්ගයට යොමු කරන්නට, ඒ වකවානුව, අපේ ගරුතර මහාසංඝ රත්නයේ වැඩපිළිවෙලවල් හේතු වුණා. අතිගරු හික්කඩුවේ ශ්‍රී සුමංගල නායක හිමිපාණන් වහන්සේ ඇතුළු ගරු මිගෙට්ටුවත්තේ, ගුණානන්ද නායක හිමිපාණන් වහන්සේ ඇතුළු ඒ යුගයේ, මහා සංඝ රත්නය, ආදර්ශය , උපදේශය, එතුමාට හුඟාක් දුරට ප්‍රයෝජනවත් වුණා. මෙ වන් ජීවිතයක් හැඩගස්වාගැනීමට ඒ චරිත කථාව සත්‍ය ලෙස ම ආචාර්ය ආනන්ද ගුරුගේ මැතිතුමා විසින් සම්පාදිත පොතේ සඳහන් වෙනවා.

ඒ තොරතුරු අප කියවන්නට ඕනෑ, විශේෂයෙන් ම අපේ හැදී වැඩී එන, දරු පරම්පරාවට, ඒ ගැන විස්තර කියා දෙන්නට ඕනෑ. මොහොට්ටිවත්තේ ගුණානන්ද ස්වාමීන්ද්‍රයාණන් වහන්සේ ධර්මය පිළිබඳ ව කළ විග්‍රහය පාණදුරා වාදයේ දේශ – දේශාන්තරවල ප්‍රචලිත වුණා. ඒ ප්‍රචලිත වුණේ, ක්‍රිස්තියානි ආගම, හෙළාදකිමින් කළ කථා නිසා නොවෙයි. මගේ ආගම උසස්. ඔය ආගම පහත්. ඔකෙ කියවෙන්නෙ ඔක්කොම බොරු. කියන විදියේ සටන්පාඨවලින් යුක්ත වෙච්ච දේශනා නිසා නම්, කවරදා වත් බාහිර ලෝකයේ, බටහිර ලෝකයේ බුද්ධිමතුන් ගේ අවධානයට ඒ දේශනා යොමු වෙන්නෙ නැහැ.

ඒ දේශනා පරීක්ෂාවෙන් කියවා බලන විට, ඒ තුළ ගැබ් වී තිබුණා. ධර්මයේ හරය. ඒ ධර්මයෙහි බෞද්ධ කියන කොටසට පමණක් සීමාවූ

හරයක් නො ව. කුමන ආගමක් ඇදහුවත්, කුමන වර්ගයෙක වුණත්, කුමන දේශයෙක වුණත්, මිනිසා විසින් පිළිගත යුතු සත්‍යය, යථාර්ථය, මිනිසා පිළිබඳ ස්වභාවය, ලෝක ස්වභාවය, බුදුරජාණන් වහන්සේ දේශනා කළ අන්දම, පැහැදිලි කොට තිබෙනවා. ජීවිතය ධර්මයට අදාළ යි. මේ නිසා තමයි, කර්නල් හෙන්රි ස්ටීල් ඕල්කොට් තුමා වැනි බුද්ධිමතුන් ගේ අවධානයට ඒ දේශනා යොමු වුණේ.

ඒ නිසා, තමයි, මේ ධර්මයේ ආභාසය සොයාගෙන එතුමා මෙන් සෙසු විදේශීය බටහිර, බුද්ධිමතුන් ශ්‍රී ලංකාව බලා ගමන් කළේ. ජීවිත අනාථ කර ගන්නා මිනිසා, මේ ධර්ම මාර්ගය කියා දුන්නොත්, මනුෂ්‍යත්වය වඩා අර්ථවත් ලෙස ගත කරයි යන හැඟීම උඩ තමයි, ධර්ම ප්‍රචාරයට, හෙන්රි ස්ටීල් ඕල්කොට් තුමා වැනි උදවිය ධෛර්යය දුන්නෙ.

ඒ වෙලාවෙ අනගාරික ධර්මපාලතුමා අතිතරුණ වියේ. එතුමා ධර්මය දැනකියා ගන්න වියේ. එතුමාට, එක අතකින්, පැවිදි උතුමන් ගේ මෙන් ම හෙන්රි ස්ටීල් ඕල්කොට් තුමා වැනි විදේශීය බුද්ධිමතුන් ගේත් ආශ්‍රය ලැබුණා. ඒ හරය ධර්මපාලතුමාට වැටහුණ නිසා යි, එතුමා මෙහෙම කල්පනා කළේ. "මට යමක් කමක් තියනවා, මට පුළුවන්කම තිබෙනවා, එහෙනම් මේ අර්ථවත් ධර්මය, මේ ප්‍රායෝගික ධර්මය කාටත් කියා දෙන්නට ඕනැ. මේ ධර්මය නොදන්න කම නිසා, මිනිසුන් අභියෝගවලට, අර්බුදවලට මුහුණපාන්ට බැරුව දුර්වල වෙන බව පේනවා. ඒ අභියෝගවලින් හෙම්බත් වෙන මිනිසා, එයින් මිදෙන්නට එයින් සහනයක් ලබන්නට සුරාව සූදුව, දුරාචාරය, හිංසාව කරා මිනිසා යොමුවෙනවා, ජීවිතයේ යථාර්ථය නොදන්න නිසා. ඊට පිළියම් බැහැරින් නො ව, තමන් තුළින් ම ඇති කර ගන්ට පුළුවන් ය යන, මේ සත්‍ය ධර්මය නොදන්න නිසා, මිනිසා විපත කරා ගමන් කරනවා. එහෙනම් මගේ යුතුකම මේ අවශ්‍ය ගමන් මාර්ගය, කාටත් ලබා දෙන්නට ක්‍රියාකිරීම"

ඔය වෙලාවේ දී අපේ රටේ ජනතාව, එ වැනි ගමන් මාර්ගයකට යොමු වෙන්නට, තිබුණ බාධා, අතිරේක වශයෙන් එතුමා දැක්කා. ඒ බාධා තමයි, එ ද අප යටත් ව විසීම. විදේශීය පාලනය තුළ අපේ මිනිසුන් ගේ ස්වාධීන හැඟීම් නැති කෙරෙන ඇඳුම් පැළැඳුම්, සිරිත් විරිත් රටපුරා ම ව්‍යාප්ත මත්පැන්හල් වැනි දේවලට පහර දෙ ්න එතුමා යොමු වුණා. අපේ රටේ ජනතාව ගේ අවධානය මේ ධර්ම මාර්ගයට යොමු කරගැනීමට, ඒවා සැබැවින් ම වූ බාධක යි.

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

## අභීත ක්‍රියාමාර්ගයක්

ඒ කාලෙ, අපේ පියා නිතර ම කියනවා, මට මතක යි, බලගතු අධිරාජ්‍යයක්, රට පාලනය කරන වෙලාවෙ, ඒ විදියට ජනතාවට කරුණු කියා ඔවුන් අවදි කිරීමට ඉදිරිපත් වීම සැබැවින් අභීත ක්‍රියාවක් බව. එතුමා ගේ පරමාර්ථය පවිත්‍ර නිසා, අරමුණ පොදු ජනතාව ගේ. සා ගේත් සුබසෙත නිසා, පෞද්ගලිකත්වය මොන විදියකින් වත් එතුමාට පෙනුණෙ නැහැ. මීට කලින් අපේ අතිගරු අකුරටියේ, අමරවංශ නායක ස්වාමීන්ද්‍රයාණන් වහන්සේ ගෙන් අවසර ලැබුණු විදියට, එතුමා පරමාර්ථයකට කැප වුණා. ඒ පරමාර්ථය වෙනුවෙන්, ක්‍රියාකරන විට, ඒ වටේ ඉන්න පුද්ගලයන් එතුමාට පෙනුණෙ නැහැ. ඒ ගැන කල්පනා කළේ නැහැ. දූන් මා දන්නවා, දූන් අප පදිංචිව ඉන්න පළාතෙ තමයි, ඒ කාලෙ හැටියට කොළඹ නගරයෙ ඉතා ම ප්‍රසිද්ධ පිටිය ප්‍රයිස්පාක් පිටිය තිබුණේ. ඕනෑම දේශකයකු ප්‍රයිස්පාක් පිටියට නැවිත් ඉන්නේ නැහැ. බොහො ම මෑතක් වෙන කල් ම ඔය පිට්ටනිය තමයි, දේශනාවලට ප්‍රසිද්ධ ස්ථානය වූයේ.

## දේශනාවකට පැමිණි ගමනක්

මට වයස තුනක් විතර වෙන්නැති ඒ කාලෙ වෙච්ච සිද්ධි මගේ පියා කියනවා මා අසා තියෙනවා. එතුමා ඔය දේශනාවලට එක් එක් අයගේ ආරාධනයෙන් ගමන් කරනවා. එතුමාට දේශනා සඳහා යෑමට විශේෂ මෝටර රථයක් තිබුණා. ඉතින් ලොකු ගෞරවයක් තමයි, යම් කෙනෙක්, අනගාරික ධර්මපාල තුමාට ආරාධනා කරලා ඒ පළාතට ගෙන්නාගැනීම. එ සේ ගෙන්නා ගත්තොත්, ගෙන්නාගැනීමට ඉදිරිපත් වූ තැනැත්තාත් ඒ ප්‍රදේශයේ සැලකිය යුතු කෙනකු වුණා.

ඉතින් මේ අපේ පළාතේ ඒ කාලේ, හොඳ දනවත් මුදලාලි මහත්මයකු හිටියා. එතුමා කියලා තියෙනවා, දූන් නොයෙක් අය ගිහිල්ලා ධර්මපාලතුමාට ආරාධනා කරලා තියෙනවා, දේශනාවකට එන්නෙයි කියලා. එතුමා පිළිගෙන නැහැ. මම කොහොම හරි ගිහිල්ලා කැඳවාගෙන එන්නම්. මෙහාට දේශනාවකට. ඇත්ත වශයෙන් ම එතුමා ගිහිල්ලා ආරාධනා කළා ම, ආරාධනාව භාරගත්තා. එයට කලින් නියෝජිත පිරිස් ගණනාවක් ගියා ම වෙන - වෙන තැන්වලට යන්න තියෙනවයි කියලා එතුමාට කියන්ට සිද්ධ වී තිබුණා.

එහෙත් කල්දිලා, එතුමා ආරාධනය භාර ගත්තා. වේදිකාවක් එහෙම හදලා දැන් මෙතුමාට ඇවිත් දේශනාව පවත්වත්ට විධිවිධාන යොදලා තියෙන්නෙ. දැන් ඒ කාලෙ අපේ වැඩිහිටියත්, කොණ්ඩෙ බැදලා අර කැස්බ ලෙලි පනාව ගහනවා ඔළුවෙ. එයත් විදේශීය ආකර්ෂණයකින් අපට ලැබිච්ච පුරුද්දක්. ඕක ගහගෙන ඉන්නවා, ඔක්කොම මුදලාලිලා කියන උදවිය විශේෂයෙන්ම. මගේ පියත් ඒ එක්කෙනෙක්. ඉතින් එ ද මේ ආරාධනාව කළ මුදලාලි දැන් බොහොම ජයට මේක ලෑස්ති කරලා බලා ඉන්නවා එතුමා එනතුරු. මෙතුමා ආවා රියෙන්. බැස්සා සෙනඟ පිරිල ඉන්නවලු. ඉතින් අර කැස්බ ලෙලි පනා ගහපු අය හුඟාක් ඉන්නවලු ඉස්සරහ. වේදිකාවට නැග්ගලු. අර ආරාධනා කළ, මුදලාලි මහත්තයට මෙහාට වරෙන් ගොන් තඩිය කිව්වලු නැගපන් මේ වේදිකාවට කිව්වලු. ගත්තලු අර පනාව අතට........ කිව්වලු මේ බලන්න, මේකගෙ මොළේ ඇතුළට මං මොන අදහසක් දන්නද මේක තියෙන කල්. මේ ඔනෙ නැති දෙයක්නෙ ඔළුවෙ ගහගෙන ඉන්නෙ. අපේ රටට නොගැළපෙන එකක්. මේ කැස්බ ලෙලි පනාව. පාගලා කඩපන් කිව්වලු. අනේ එකපාරටම ඒ මුදලාලි ඒක අරගෙන වේදිකාවෙ තියල පාගලා කැඩුවා ලු.

අනික් ඔක්කෝම මේ කැස්බ ලෙලි පනා ගහගෙන ඉන්න අය, මගේ පියා ඇතුළු, විගහට කඩලා දැම්මලු. ඒ වෙලාවෙ එතුමාට පෙනුනෙ නැහැ, තමාට ආරාධනා කළ මුදලාලි ඔහු බව. ඔහුට අපහාසයක් කරන්න නෙවෙයි එ සේ කෙළේ. එතුමා නැන දුන්නේ පුද්ගලයාට නො වෙයි. ජාතික පරමාර්ථයකට යි.

කලිසම ගැන එතුමා ගේ විරෝධයක් තිබුණේ ඇයි ? ඒකෙන් වහල් මානසිකයක් ජනිත වෙන නිසා. ඇඳුමක් හැටියට එය ප්‍රතික්ෂේප කළා. එතුමාගේ ලියුම් කියුම් කියවන විට එතුමා ගේ උත්තරීතර ජාතික අරමුණ වැටැහෙනවා.

අධිරාජ්‍යවාදීන් ගේ ඇඳුමක් හැටියට යි, අපේ ජනතාව කලිසම ඇන්දේ ; විශේෂ ගෞරවයක් සඳහා යි. එහෙම නැතුව ඇඳුමක් හැටියට පරිහරණය කළා නෙවෙයි. ටයි එකක් දැම්මෙ, කෝට් එකක් ඇන්දෙ, ඔය විධියට, අපේ රටට දේශගුණය, හැදියාවට, ඒ වගේ ම අපේ ආර්ථිකයට ඔරොත්තු නොදෙන වැඩපිළිවෙළවල් ගෙන ගියේ පුහු ආටෝපයක් රැකීමට යි. එතුමා එය හෙළා දැක්කෙ තේරුමක් ඇතුව යි. එහෙම නැතුව

ඒ ඇඳුම අඳින ජාතියට හෝ ඒ සිරිත් විරිත් අනුගමනය කරන විජාතිකයන්ට හෝ අපහාසයක් කරන්නට නොවෙයි. මෙන්න මේ අංශය අප තේරුම් ගන්නට ඕනෑ.

ධර්මපාලතුමා ගේ ජීවිතය පිළිබඳ තොරතුරු, ලියකියවිලි, දැනගතයුතු කරුණු, මේවා කියවන්නට, කියවන්නට පෙනෙනවා, ඒ කොයි දේ කළෙත් අප ගේ මානසික වහල් භාවය ඉවත් කරන්න යි. එය එදා යටත් යුගයෙහි අත්‍යවශ්‍ය වූ දෙයෙකි. එහෙත් තවමත් ඒ මානසික වහල්භාවය අප අතර පවතින බව පෙනේ. අපට භාෂාවක්, ඇඳුමක්, මානසික චේතන් චාරිත්‍ර-වාරිත්‍ර සමුදායයක් අත්‍යවශ්‍ය වෙන්නෙ, අපේ අනන්‍යතාව රැකීමට මිස එයින් උමතු වී මිනිසුන් අතර සමගි සමාදානය නැති කරන්නටවත් නොවෙයි.

සිංහල භාෂාවෙන් යමක් කියන්නට පුළුවන් තැන ඒ භාෂාව තේරෙන උදවිය අතර, ඉංග්‍රීසිය පාවිච්චි කරනවා නම්, එහෙනම් අන්න ඉංග්‍රීසි භාෂාවට අප වහල් වුණා. ඇඳුම කැඩුම වුණත් එහෙම යි. වියළි කලාපයේ ගිනිගෙන දැවෙන පළාතකට යනවා නම් බෙල්ල-කර හිර කරගෙන, ටව්ඩ් සූට් ඇඳගෙන, යටටත් කෝට් ඇඳගෙන යන මනුස්සයා පුදුම වහලෙක් නෙ මේ ඇඳුමට !

අධිසීතල තියෙන රටකට යනවා නම්, ඉතින් ඒ සීතල මකාගන්නට ඕනෑ ඇඳුමක් ඇඳගන්නට කිසි ම වරදක් නැහැ. නැත්නම්, අපේ රටේ චාරිත්‍ර එහෙම නැන දී අනුගමනය කරලා සීතලේ මැරෙන්නට ඕනෑ යැ ? යථා පරිදි, යථායෝග්‍ය පරිදි, අපේ අත්‍යවශ්‍ය කම් සපුරාලන්නට මේවා ඔක්කොම වහලුන් හැටියට අප පාවිච්චි කළ යුතු යි. ඒව ට අප වහල් නො විය යුතු යි. පසු කාලයක බොහො ම හොඳට මේක විග්‍රහ කරල තිබුණා, මාටින් වික්‍රමසිංහ සූරීන්, වහලුනට, ' වඳින-පුදන-උගත්තු' කියලා.

ධර්මදූත මෙහෙය

ධර්මපාලතුමාගේ ධර්මදූත මෙහෙයේ විශිෂ්ටත්වය වූයේ එය වෙනත් ආගම ධර්මයක් හෙලා දකින්නට ක්‍රියා නොකිරීම යි.

ධර්මපාලතුමා ගැන කථා කරන විට, චිකාගෝ නුවර පැවති ඓතිහාසික දෘෂ්ටි සම්මේලනය. එක වර ම අපේ මතයකට නැඟෙනවා.

මේ දෘෂ්ටි සම්මේලනයට ආරාධනා කරන කොට, එතුමා හිටියෙ ජපන් රටේ. චිකාගෝ නුවර ඒ දෘෂ්ටි සම්මේලනයේ සංවිධායකයන්, ධර්මපාලතුමා හැඳුන්නුවෙ ජපන් රටින් එන බෞද්ධ නියෝජිතයා හැටියට යි. මොකද ඒ දවස්වල එතුමා හිටියෙ ජපන් රටේ. ඒ දෘෂ්ටි සම්මේලනයේ දී එතුමා, කළ කථාව, අපි යළි-යළිත් කියවන්නට ඕනෑ.

අප වරක් පාර්ලිමේන්තු සම්මේලනයකට යන අතරේදී, වොෂින්ටන් නුවර කොන්ග්‍රස් පුස්තකාලෙ, පුස්තකාලයාධිපතිතුමා, ලංකාව ගැන තොරතුරු කථාකරන වෙලාවෙ ඒ දෘෂ්ටි සම්මේලනයෙ සම්පූර්ණ වාර්තාව ගැන සඳහන් කරමින් තමා කීප විටක්ම කියැවූ කථාව අනාගාරික ධර්මපාලතුමා කළ කථාව බව කීවා. ඒ කථාවේ බුදු දහමේ ප්‍රායෝගිකත්වය. එයින් මිනිසාට ලැබිය හැකි තෘප්තිය. අභියෝගවලට මුහුණ දෙන්ට පුළුවන් ශක්තිය ගැන සඳහන් වෙනවා.

එතුමා ගේ කථාවෙන් පස්සෙ ප්‍රශ්න කීපයකුත් මතු වුණා. එක නියෝජිතයකු එතුමා ගෙන් ඇහුවා මෙහෙම : තමුන්නාන්සේ මේ ජීවිතයේ දුක්බර පැත්ත ම කිව්වා ......... එහෙමනම් මේ ජීවිතයේ අපට ප්‍රීතියක් කියලා ලබන්නට එකක් නැද්ද ? ...... මොකක්ද මේ ප්‍රීතිය කියන්නෙ ?

ඒ වෙලේ ම එතුමා දීපු පිළිතුර මොකක් ද ?

"අපි යමක් කියල — කරල, ඒ මොහොතේ හෝ කලක් ගියාට පස්සෙ, අප දුකට පත් වෙන්නෙ නැද්ද ? සතුටක් ලබන්නෙයි කියල කියපු දේ, කරපු දේ දැන් මෙක මට දුකක් නේද කියල හිතුණොත්, එහෙනම් ඒක ප්‍රීතියක් වෙනවා ද ?

තමන් යමක්, කිව්වට — කෙරුවට පස්සෙ, ඒනිසා වඩ වඩාත් සතුට වැඩිවෙනවා නම්, අන්න ඒක තමයි, නියම ප්‍රීතිය. මේ පිළිතුර දීපු හැටියට, තවත් එ වැනි ම ධර්මදූතයකු, වහා පැමිණ, ධර්මපාලතුමා වැළඳගත්තා. ඒ තමයි, ස්වාමි විවේකානන්ද. ඒ වන විට ස්වාමි විවේකානන්ද කථා කරලා, ඉවර යි. ස්වාමි විවේකානන්ද ගෙ කථාවෙනුත්, ධර්මපාලතුමා ආස්වාදයක් ලබලා හිටපු වෙලාව යි ඒ. ධර්මපාලතුමා මෙහෙම කීවා ලු : මා බලාගෙන හිටියෙත් සම්මේලනයෙ කටයුතු ඉවර වුණාම තමුන්නාන්සේ කළ කථාවෙ, උදාරත්වය ගැන මගෙ සතුට පළ කරන්නට යි".

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

"නැහැ ධර්මපාල, අප දෙන්නම හිතන්නෙ එක විදියට බව යි, මට කියන්නට තිබෙන්නෙ." මෙයින් ලොකු මිත්‍රත්වයක් ඇති වුණා, ස්වාමි විවේකානන්දතුමා සමග. පසුකාලයක මේ දෙදෙනා අතර ඇතිවෙච්ච සබැදියාව කොයි තරම් ද කිව්වොත්, ඉන්දියාවට ගිය වරෙක, ධර්මපාලතුමා ස්වාමි විවේකානන්ද තුමා හම්බ වෙන්නත් ගියා. රථයෙන් බැහැලා, යන මග එදා වැහැල මඩ සහිත වී තිබුණා. ස්වාමි විවේකානන්ද තුමා දැක්ක මේතුමා එනවා. වතුර බාල්දියක් අරගෙන ඉදිරියට ගියා, 'අයියෝ බොහො ම කනගාටු යි, අද වැහැලා, මේ මඩ වෙලා තියෙන්නෙ ? එන්න, මම ඔබෙ කකුල හෝදන්නම්" කියල භාජනයෙන්, එතුමා ගේ දෙ පයට වතුර වක්කරන්න ලෑස්ති වෙන කොට, ධර්මපාලතුමා වහා නතර කළා. 'අපෝ ඒක වුවමනා කරන්නෙ නැහැ.' මම ම හෝද ගන්නම් . . . . '

'නැහැ, ඔබ ඒ විදියට අප පිළිගත යුතු පුද්ගලයෙක් . . . . . ' කියලයි කිව්වෙ. ස්වාමි විවේකානන්ද අදහස් ධර්මපාල තුමාගේ අදහස් හා ඒ තරමට ගැලපුණා. ඇයි, වෙනත් බාහිර කරුණුවලට වඩා හරය සදහා ම හිතපු නිසා, ක්‍රියා කළ නිසා. ඒවගේ උදාර ජීවිතයක් අනගාරික ධර්මපාලතුමා ගේ ජීවිතය. අප ඒ ජීවිතයෙන්, විශේෂ ආභාසයක් ලබන්නටයි මේ කටයුතු කරන්නෙ.

ධර්මපාල තුමා වෙනුවෙන්, උත්සව පැවැත්වීම, ධර්මපාලතුමා ආරම්භ කළ මහාබෝධි සමාගමේ ශත සාංවත්සරය සිහිපත් කිරීම, කුමක් සදහා ද ?

ඒ ජීවිතයෙන් අපට ලබාගන්න පුළුවන් හරය උකාගැනීම සදහා යි අපේ ජීවිත තුළටත්, එයින් ආභාසයක්, ආදර්ශයක්, ලබාගැනීම සදහා යි. එහෙම නැතුව, එතුමා වෙනුවෙන්, උත්සව පැවැත්වීමෙන් පමණක්, ප්‍රයෝජනයක් නැහැ. අපි යම් කෙනකුට උපහාරයක් දක්වනවා නම්, ඒ ජීවිතයෙන් අපට ලබන්න පුළුවන්, ආභාසය ලබාගත යුතු ම යි.

### විවිධ ක්‍රම සම්පාදනය

අද ප්‍රකාශ වුණා ධර්මපාල තුමාගේ ජීවිතයේ විවිධත්වය ගැන. එතුමා එක් අතකින් වහල් මානසිකය නැතිකරන්නට ක්‍රියා කළා. අනික් අතින් ජීවිතයට හරයක් ලබාදෙන ධර්ම මාර්ගය පතුරුවන්නට ක්‍රියා කළා. තවත් අතකින්, එතුමා මිනිසා ගේ ආර්ථික තත්ත්වය වැඩිදියුණු කරන්න, වුවමනා කරන ක්‍රම සම්පාදනය, මතු කළා.

තිම්තිකරගෙන. ඇතිකරපු වැඩ පිළිවෙළ. කොයිතරම් උසස් ද කියන එක. වැටහෙනවා.

ධර්ම මාර්ගය

මා 1950 දිත් ගිහිල්ල තිබෙනවා. දඹදිව වන්දනාවෙ. ඒවෙලාවේ දී ම. මා දුක්කා. ජවහල්ලාල් නේරු මැතිතුමා ගේ අනුග්‍රහය. එහෙත් 1988 ගියා ම. හොඳට ම පෙනුණේ. බුද්ධ ජයන්තියෙන් පසු ව. ඒ බුද්ධ ජයන්තිය වෙනුවෙන්. එතුමා ගේ විශේෂ මූලිකත්වයෙන් එතුමා ඇතිකරපු වැඩපිළිවෙළ. කොයි තරම් උදාර ද කියල.

එතුමා කල්පනා කළේ මේ ඓතිහාසික සිද්ධස්ථාන. මුළු මිනිස් වර්ගයාට ම අයත් ලෙසට යි සම්බුදු පියාණන් විසින් පාරිභෝග කරන ලද මේ සිද්ධස්ථාන පිහිටි ප්‍රදේශවලින් තමයි. මිනිසාට නියම විමුක්තිය දෙන මාර්ගය ලොවට විහිදුණේ. ඒ ඒ යුගයේ රාජ-රාජ මහාමාත්‍ය ආදීන්. අනුග්‍රහය දක්වපු ආකාරය අපිත් යුගයෙන්. යුගය මේ ආරක්ෂා කළ යුතු ය කියා පණ්ඩිත ජවහල් ලාල් නේරු මැතිතුමා. ලියපු වැකි. කළ ප්‍රකාශ ආදියේ සඳහන් වෙනවා.

ඒ වගේ ම ඉස්ලාම් රටක් හැටියට. පිළිගෙන තිබෙන පාකිස්ථානයට ගියත් මේ සිද්ධස්ථාන කොයි තරම් උසස් අන්දමින් ආරක්ෂා කරනවද කියලා අපට පේනවා. ඒ ස්ථානවලට ගියා ම. මුස්ලිම් ජාතිකයන්. අපේ ඓතිහාසික බෞද්ධ පුරාවෘත්තය. අපට ඉතා උසස් අන්දමින් කියා දෙනවා. මෙයින් පැහැදිලි වන්නේ කිමෙක් ද ? ඒකෙන් තේරෙන්නෙ. සාමාන්‍ය ආගමක් හැටියට පමණක් බුදු දහම නොසැලැකෙන බවයි එය ධාර්මික ජීවන ක්‍රමයක්. ජීවන මාර්ගයක්. කුමන ජාතියකට. කුමන ආගමකට. කුමන රටකට. අයිති වුණත්. මිනිසකු හැටියට. තමන් ගේ මනුෂ්‍යත්වය රැකගනිමින්. ලෝක ස්වභාවයෙන් ඇති වන්නා වූ. අර්බුද සහ අභියෝගවලට. මුහුණු දෙන්ට පුළුවන් ධර්ම මාර්ගය මේ ධර්මය තුළ රැඳී තිබෙනවයි කියන පිළිගැනීම ලොව පුරාම ඇතිවේගන එනවා. අපේ සිත නිසි විදියට හසුරුවාගත්තොත්. අපට මේ හැම අභියෝගයකට ම මුහුණ දෙන්ට පුළුවන්කම. ඇති බව මුළු ලෝකයේ ම අවධානයට යොමු වේගන එන අවස්ථාවෙකි මේ. මඩිහේ පඤ්ඤාසීහ මහානායක මාහිමිපාණන් වහන්සේ. සඳහන් කළා සේ ඒ බලවේග බුදුරජාණන් වහන්සේ ගේ කාලයේත් තිබුණා. උන් වහන්සේ උත්සාහ කළේ. කරුණු

අවබෝධ කර දීමෙන් ම, මේ තපුරු තරක පැති වලට මිනිසා යොමු කිරීම නතර කරන්නට යි. ධර්මාසෝක මහරජතුමා ද, තමන්ගේ රාජ තන්ත්‍රය තුළින් ඒ වැඩපිළිවෙළවලට ආධාර උපකාර කළා. එතුමා පෙන්නුවා, රාජ්‍ය තන්ත්‍රය තුළටත්, මේ ධාර්මික ප්‍රතිපත්ති ඇතුළු කරන්න පුළුවන් බව. අපත් ඒවායින්, පාඩම් ඉගෙන ගෙන, ක්‍රියාකළ යුතු යි.

මෙ වර අපේ රජය, සිංහල සහ හින්දු අවුරුදු කාලෙ, අප මත්පැන් හල් වහන්න කිව්වා. මස්කඩ ආදිය වහල දමන්න කිව්වා. ඒකත් විවේචනයට භාජනය වුණා. එහෙමත් කල්පනා කරන අය ඉන්න සමාජයක් මේ. ඒ වුණාට අපට බෑ, ඒ උදවිය වුණත් ප්‍රතික්ෂේප කරන්න. පුළුවන් තරම් ඒ උදවියටත්, කරුණු කියාදීලා අවබෝධයක් ඇති කරන්නට උත්සාහ කරන්න ඔනෑ. බුදුරජාණන් වහන්සේ ගේ ධර්ම මාර්ගය ද ඒක යි.

අනගාරික ධර්මපාලතුමා, ඒ වහල් කාලයේ දීත්, ඒ වැඩපිළිවෙළ ඒ ධර්ම මාර්ගය ක්‍රියාත්මක කිරීම සකස් කළා. දැන් අපි ස්වාධීන රාජ්‍යයක් හැටියට, ටිකෙන් ටික මේ වැඩ පිළිවෙලවල් අපේ පාලන තන්ත්‍රය තුළට ඇතුළු කරන්ට ක්‍රියාකරනවා. ඊට කාගේත් සහයෝගය ලබාගන්නවා. එ සේ කළොත් තමයි, අපට පුළුවන් වෙන්නේ ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමාටත්, මහාබෝධි සමාගමේ ව්‍යාපාරයටත් අපේ උපහාරය පිරිනමන්න.

සියලු දෙනාට ම බොහො ම ස්තුති යි !

ජනාධිපති ලේකම් කාර්යාලය

26 AUG 2023